# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2007

### බෞද්ධ දර්ශනය -BUPH- E1015

### භාරතීය දාර්ශනික පසුබිම හා බෞද්ධ දර්ශනයේ මූලධර්ම

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි　　　　　කාලය : පැය 03 යි

---

01. වෛදික චින්තාවෙහි සඳහන් මනුෂ්‍යතත්ත්වාවරෝපණයේ සිට ඒක දේවවාදය දක්වා දේව සංකල්පයේ විකාශය සැකෙවින් පැහැදිලි කරන්න.

02. බ්‍රාහ්මණ යුගය තුළ මිනිසාගේ ආධ්‍යාත්මික වර්ධනයකට වඩා ලෞකිකත්වය වර්ධනය වීමට පාදක වූ හේතු සාධක පෙන්වා දෙන්න.

03. "ආරණ්‍යක යුගයේ ඇති වූ දාර්ශනික ප්‍රබෝධය සන්‍යාසී ආශ්‍රමයේ වර්ධනයක් වශයෙන් පමණක් අගය කළ නොහැක." සාකච්ඡා කරන්න.

04. මිනිසා සහ විශ්වය අතර සම්බන්ධය පැහැදිලි කිරීමට උපනිෂද් මුනිවරුන් ගත් උත්සාහයන් පැහැදිලි කරන්න.

05. බුද්ධ කාලය වන විට භාරතය තුළ පැවැති ශ්‍රමණ සම්ප්‍රදායට අයත් මූලික ලක්ෂණ කවරේදැයි පැහැදිලි කරන්න.

06. 'බුදුරජාණන් වහන්සේගේ ධර්මය එවකට පැවැති දේශපාලන ආර්ථික හා සමාජීය ප්‍රශ්නවලට ද අනුකූල වූවකි.' අදහස් දක්වන්න.

07. 'දුක්ඛ සත්‍යය ලෝකයේ යථා ස්වභාවය පැහැදිලි කිරීමට ගන්නා ලද සාර්ථක උත්සාහයක් වශයෙන් අගය කළ හැකිය.' විමසන්න.

08. බුදුරජාණන් වහන්සේ ජීවත් වූ කාලයෙහි පැවැති ප්‍රධානතම දාර්ශනික අන්තවාදයන් හඳුන්වා දී බුදුදහමින් නිර්දේශිත මැදුම් මාර්ගය පිළිබඳ ඇගයුමක යෙදෙන්න.

09. ස්කන්ධ, ධාතු, ආයතන හා ත්‍රිලක්ෂණ දේශනා පාදක කොට ගනිමින් සත්ත්වයාගේ සහ ලෝකයේ ස්වභාවය පිළිබඳ බෞද්ධ ස්ථාවරය පැහැදිලි කරන්න.

10. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් <u>**දෙකකට**</u> කෙටි සටහන් සපයන්න.

i. වරුණදේව සංකල්පය

ii. අසමර්ෂණගේ කාලවාදය

iii. දස අව්‍යාකෘත ප්‍රශ්න

iv. ජෛන මහාවීර

**************************